**ශීර්ෂය 231 - ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 231 - ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජුනි 25 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තරකර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශනය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතු ය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු ය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මකකර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

2023 නොවැම්බර් 30 දිනැති අංක 05/2023 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථාවක් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 7.9 ඡේදයේ සඳහන් උපදෙස් අනුව වාර්තා කරන ආයතනයේ අත්තිකාරම් ගිණුම්වල වටිනාකමෙන් තැන්පතු ගිණුම්වල වටිනාකම අඩු කිරීමෙන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ශුද්ධ වත්කම්/ ස්කන්ධය යටතේ ඇති "භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්" ලෙස දැක්විය යුතු වුවද, තැන්පතු ගිණුම් ශේෂය නොදැක්වීම හේතුවෙන් භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් රු.2,488,903 ක් ලෙස රු. 5,275 ක් අඩුවෙන් දක්වා තිබුණි. | තැන්පතු ගිණුම් ශේෂයෙහි සිදු වූ මගහැරීම හේතුවෙන් ශුද්ධ වත්කම් අඩුවෙන් සඳහන්ව ඇත. එහි අගය රු.2,483,628 ක් ලෙස නිවැරදි විය යුතු බව දන්වා තිබුණි. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු ය. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) තැන්පතු**

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ තැන්පත් ගෙවීම් හා ශේෂ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩුව නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තැන්පතු ගිණුම් ශේෂය භාණ්ඩාගාර මුද්‍රිත සටහන් SA 30 අනුව රු.5,275 ක් වුවද, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ 2023 දෙසැම්බර් 31 දිනට ජංගම වගකීම් යටතේ තැන්පතු ගිණුම් ශේෂයක් නොදැක්වීම හේතුවෙන් ජංගම වගකීම් රු.5,275 ක් අඩුවෙන් දක්වා තිබුණි. | මූල්‍ය තත්ත්ව ප්‍රකාශය පිළියෙල කිරීමේදී ඒ.සී.ඒ 4 හි තැන්පතු ගිණුමේ රු.5,275 ක ශේෂයක් දක්වා තිබුණ ද, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය වෙත එය දැක්වීම මගහැරී ඇත. 2024 මූල්‍ය ප්‍රකාශනය පිළියෙල කිරීමේදී මෙවැනි දෝෂ සිදු නොවීමට කටයුතු යොදා ඇති බව දන්වා තිබුණි. | මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ තැන්පතු ශේෂය භාණ්ඩාගාර මුද්‍රිත SA 30 අනුව දැක්විය යුතු ය. |

**(ආ) දේපල පිරියත හා උපකරණ**

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩුව අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 ජනවාරි 19 වන දින අධිකරණ අමාත්‍යාංශයේ බන්ධනාගාර | 2023 වර්ෂයේ අධිකරණ අමාත්‍යාංශය විසින් ලබාදුන් | වර්ෂය තුළ මාරු කිරීම් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ මාරු |

| | | |
|---|---|---|
| අංශයෙන් ප්‍රින්ටරයක් ලබා ගෙන තිබුණු අතර, මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ මාරු කිරීම් යටතේ රු. 75,000 ක් ලෙස සටහන් නොකර එය වර්ෂය ආරම්භක ශේෂයේ එකතු කිරීම් යටතේ පෙන්වා තිබුණි. | සියලුම මූල්‍ය නොවන වත්කම් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් ලබාදුන් වාචික උපදෙස් අනුව අමාත්‍යාංශයෙන් ලද සියලුම මූල්‍ය නොවන වත්කම් ශේෂයන් ආරම්භක ශේෂ ලෙස ඇතුළත් කෙරුණි. ඉදිරියේදී මෙවැනි ලැබීම් මාරු කිරීම් යටතේ ඇතුළත් කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | කිරීම් යටතේ සටහන් කළ යුතු ය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුනරාවර්තන වැය විෂයයන් 11 ක් සඳහා රු.67,400,000 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.15,183,681 ක් ඉතිරි වී තිබුණු අතර එම ඉතිරිය සියයට 06 සිට සියයට 100 දක්වා පරාසයක් ගෙන තිබුණි. | කුරුණෑගල, ගම්පහ සහ ගාල්ල ශාඛා කාර්යාල විමධ්‍යගත වීම හේතුවෙන් නිලධාරීන්ගේ කටයුතු සහ නිරීක්ෂණය කිරීම් සඳහා ප්‍රධාන කාර්යාලය වෙත පැමිණීම අඩුවීම තුළින් ගමන් වියදම් හා සංයුක්ත දීමනා ගෙවීම් සීමා වූ අතර, 2023 වර්ෂයේ සැලසුම් කරන ලද ශාඛා කාර්යාල ආරම්භ කිරීම් සිදු නොවීම හේතුවෙන් ද ප්‍රතිපාදන ඉතිරිවී ඇති බව දන්වා තිබුණි. | සකසුරුවම හා කාර්යක්ෂමතාවය පිළිබඳ අවධානය යොමු කරමින් නිසි සැලකිල්ලෙන් යුතුව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු ය. |
| (ආ) | එක් මූලධන වැය විෂයයක් සඳහා ප්‍රතිපාදිත රු. 300,000 ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | 2023 අයවැය සකස් කිරීමේදී අගය වැඩිකිරීම් සිදුකළ යුතු යැයි පුරෝකථනය සිදුකර 231-1-1-2003 යටතේ රු.300,000 ක් දක්වා ඇත. නමුත් 2023 වර්ෂයේදී වාහන පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම් සිදු නොවූ බැවින් අදාළ ප්‍රතිපාදන මුළු ප්‍රමාණයම උපයෝජනය නොවුණු බව දන්වා තිබුණි. | සකසුරුවම හා කාර්යක්ෂමතාවය පිළිබඳ අවධානය යොමු කරමින් නිසි සැලකිල්ලෙන් යුතුව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු ය. |

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 1403 වැය විෂයයෙහි බැරකම් වටිනාකම රු. 84,270 ක් වුව ද, එය රු. 71,795 ක් අඩුවෙන් රු.12,475 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනයේ සටහන් (iv) හි බැරකම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා තිබුණි. | 1403 යටතේ විදුලි හා ජල බිල්පත්, බිල්පත් කාලසීමාව සලකා බැරකම් ලෙස 2023 දෙසැම්බර් පමණක් හඳුනා ගන්නා ලදී. එසේම බිල්පත් කාලසීමාවේදී අඩු දින ප්‍රමාණයක් පවතී නම් එය ඉදිරි කාලසීමාවට අදාළ බිල්පතක් ලෙස හඳුනාගන්නා ලදී. | බැරකම් පිළිබඳ විස්තර නිවැරදිව මූල්‍ය ප්‍රකාශනයෙහි සටහන් කළ යුතු ය. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථාව පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම | | |
| **ව්‍යවස්ථාපිත විධිවිධාන** | | | | |
| 2019 අංක 04 දරන ණය සහනදායක (සංශෝධන) පනතෙහි 8(3) වගන්තිය | - | නීතිඥවරයකු ලෙස අවුරුදු 10 කට නොඅඩු වෘත්තීය අත්දැකීම් සහිත හෝ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ හෝ දීප ව්‍යාප්ත සේවයක 1 වන ශ්‍රේණියේ ධූරයක තනතුරක් දරන හෝ දරා ඇති තැනැත්තන්ගෙන් මණ්ඩල සාමාජිකයන් සමන්විත විය යුතු වුවද, එයට පරිබාහිරව ගාල්ල ශාඛා මණ්ඩලයට එක් සාමාජිකයකු 2022 අගෝස්තු 22 දින පත්කර තිබුණු අතර එම සාමාජිකයාගේ පත්වීම 2024 පෙබරවාරි 08 දින දක්වා දීර්ඝ කර තිබුණි. | මණ්ඩලයේ සියළු පත්කිරීම් සිදුකරනුයේ අධිකරණ අමාත්‍යතුමා බැවින් මේ සම්බන්ධව පිළිතුරු ලබාදිය නොහැකි බව දන්වා තිබුණි. | යොමුගත පනත ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දින වන විට ප්‍රධාන කාර්යාලයේ 162 ක් ද, කොළඹ ශාඛාවේ 159 ක් ද, ගම්පහ ශාඛාවේ 383 ක් ද, ගාල්ල හා කුරුණෑගල ශාඛාවල පිළිවෙලින් 212 ක් හා 241 ක් ලෙස එකතුව 1157 ක් වූ අයදුම්පත් සංඛ්‍යාවක් විසඳීමට ඉතිරි වී තිබුණි. | 2022 වර්ෂයේදී දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය සියයට 44 ක් වූ අතර, 2023 වර්ෂයේදී එය සියයට 49 ක් බව දන්වා තිබුණි. | නඩු විසඳීමට කඩිනම් පියවර ගත යුතු ය. |
| (ආ) | 2009 වර්ෂය දක්වා භාර ගන්නා ලද, 2023 දෙසැම්බර් 31 දින වනවිට ද, නොවිසඳුණු නඩුගොනු 12 ක් තිබුණු අතර, මේ තුළ විමසීම සඳහා කාලය ලබා ගන්නා ලද නඩුගොනු සංඛ්‍යාව 07 ක් විය. ඒ අනුව වසර 14 කට අධික කාලයක සිට නොවිසඳී පැවත එන නඩුගොනු පවතින බව නිරීක්ෂණය විය. | මේ සම්බන්ධව ප්‍රධාන මණ්ඩලයෙන් හා ශාඛා මණ්ඩලවල සභාපතිවරුන් ලිඛිතව දැනුවත් කර එම නඩුගොනු ඉක්මනින් විසඳීම සඳහා යෝජනා හා අදහස් විමසා ඇති බව දන්වා තිබුණි. | නඩු විසඳීමට කඩිනම් පියවර ගත යුතු ය. |

### 3.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තා මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ගතවීමට පෙර පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවද, 2022 වර්ෂයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර තිබුණේ 2023 සැප්තැම්බර් 21 දින ය. | පෙර පරිදි වාර්ෂික කාර්යසාධන වාර්තාවේ පිටපත් විශාල සංඛ්‍යාවක් මුද්‍රණය කිරීම සඳහා පැවති ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ බැවින්, පාර්ලිමේන්තුවේ සභානායක ලේකම්ගේ 2022.06.10 හා LHP/ PA/01-2022/ Reports දරන ලිපිය අනුව පොත් මුද්‍රණය කිරීම සිදු කරන ලද බව දන්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

### 3.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මෝටර් රථ දෙකක් සඳහා මිලදී ගන්නා ලද ටයර් වෙනුවෙන් එකතුව රු.188,000 ක බිල්පත්වලට හා රු.224,000 ක වියදමක් දරා වාහන අලුත්වැඩියාවට අදාළ බිල්පතට ගෙවීම් කිරීමේදී අදාළ කාර්යයන් නිසි පරිදි ඉටු කර තිබුණු බවට යාන්ත්‍රික ඉංජිනේරුවරයකුගේ නිර්දේශ ලබා ගැනීමකින් තොරව ගෙවීම් කර තිබුණි. | යාන්ත්‍රික ඉංජිනේරුවරයා වෙත ඉදිරිපත් කර ගෙවීම් අනුමැතිය ලබා ගෙන එය නිවැරදි කර ඇති බව දන්වා තිබුණි. | අලුත්වැඩියාවන්ට අදාළ ගෙවීම් කිරීමට පෙර යාන්ත්‍රික ඉංජිනේරුවරයකුගේ නිර්දේශ ලබා ගත යුතු ය. |

### 3.4 රජයේ නිලධාරීන් ඇප තැබීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව පරිපාලනමය වශයෙන් වගකිව යුතු හෝ බලය පැවරීම් යටතේ එම කටයුතු පවරනු ලැබ ඇති හෝ නිලධාරීන් ද, රජයේ ගිණුමට අදාළ වවුචර සහතික කරන, චෙක්පත් අත්සන් කරන අය ද, ස්වකීය රාජකාරී කටයුතු අවංකව ඉටු කරන බවට 612 වැනි අධිකාරිය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට හා අධිකරණ අමාත්‍යාංශයේ 2011 ජනවාරි 18 දිනැති අංක 01/2011 දරන චක්‍රලේඛය අනුව ඇප තැබිය යුතු නිලධාරීන් 12 දෙනෙකු ඇප තබා නොතිබුණි. | නිලධාරීන්ගේ ඇප අයදුම්පත්‍ර ඉදිරි කටයුතු සඳහා අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කර ඇති බව දන්වා තිබුණි. | යොමුගත මුදල් රෙගුලාසි 880 හා රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු ය. |

**3.5 කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 වර්ෂයේ අගෝස්තු මාසයේ ප්‍රධාන කාර්යාලයේ ද, 2023 නොවැම්බර් මාසයේ ප්‍රධාන කාර්යාලය ඇතුලු සියලුම ශාඛා කාර්යාලවල ද නඩුගොනු අතින් ගණන්කර තිබුණු අතර, එහිදී ලේඛනගත තොරතුරුවලට වඩා 2022 වර්ෂයේ නඩුගොනු 248 කින් ද, 2023 වර්ෂයේ නඩුගොනු 221 කින් ද, වැඩි වී තිබුණි. ඒ අනුව, 2023 වර්ෂයේ අතින් ගණන් කිරීම නිසා ප්‍රධාන කාර්යාලයේ නඩුගොනු 83 කින් ද, කොළඹ හා ගම්පහ ශාඛාවල පිළිවෙලින් 48 කින් හා 84 කින් ද, වැඩිවීමක් සිදු වී තිබුණි. මෙසේ වරින් වර ගණන් කිරීමේදී ලේඛනගත තොරතුරු හා භෞතික තොරතුරු එකිනෙකට වෙනස් වීම මත ලිපිගොනු නඩත්තුව සඳහා නිසි අභ්‍යන්තර පාලන පද්ධතියක් හඳුන්වාදී නොතිබුණු බව නිරීක්ෂණය විය. | UNDP ආයතනය විසින් නව දත්ත පද්ධතියක අකෘතියක් ලබාදීමට අවශ්‍ය කටයුතු කරමින් පවතින බව දන්වා තිබුණි. | නිසි දත්ත පද්ධතියක් හඳුන්වාදීමට කටයුතු කළ යුතු ය. |

**4. මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.3 වගන්තිය ප්‍රකාරව වැඩ බැලීමේ පත්වීමක් සිදු කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් ලෙස වුව ද, ජ්‍යෙෂ්ඨ මට්ටම තුළ ඇතුළත් ගණකාධිකාරී තනතුර 2021 මාර්තු 17 වන දින සිට | මෙම පුරප්පාඩුව සම්පූර්ණ කරගැනීම සඳහා මාගේ සමාංක 3/1/24 හා 2023.09.01 දිනැතිව ලිපියක් යොමු කරමින් ඉල්ලීම්කර ඇතත්, මේ වන විට ස්ථාන මාරු කළ හැකි ගණකාධිකාරී සේවයේ III/I ශ්‍රේණියේ නිලධරයන් නොමැති බව දන්වා ඇත. | පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | පුරප්පාඩුව පවතින අතර, අමාත්‍යාංශයේ ගණකාධිකාරී විසින් මෙම තනතුරෙහි වැඩ බැලීම සිදු කරනු ලබයි. | | |
| (ආ) | ද්විතීක මට්ටම තුළ ඇතුළත් සංවර්ධන නිලධාරී තනතුර සඳහා අනුමත සේවක සංඛ්‍යාව 18 ක් වුවද, තථ්‍ය සේවක සංඛ්‍යාව 19 ක් වූයෙන් අතිරික්ත සේවක සංඛ්‍යාව 01 ක් වී තිබුණු අතර, කළමනාකරණ සේවා නිලධාරී තනතුර සඳහා අනුමත සේවක සංඛ්‍යාව 15 ක් වුවද, තථ්‍ය සේවක සංඛ්‍යාව 06 ක් වූයෙන් පුරප්පාඩු 09 ක් පැවතුණි. තවද, ලඝු ලේඛක තනතුර සඳහා අනුමත සේවක සංඛ්‍යාව 06 ක් වුව ද, තථ්‍ය සේවක සංඛ්‍යාව 03 ක් වූයෙන් පුරප්පාඩු 03 ක් පැවතුණි. | සංවර්ධන නිලධාරීන් 03 ක් අධිකරණ අමාත්‍යාංශයෙන් තාවකාලික අනුයුක්තිය මත ලබාදී ඇති බැවින්, සංවර්ධන නිලධාරී තනතුරු 02 ක් පුරප්පාඩුව පවතින අතර, කළමනාකරණ සේවා නිලධාරී තනතුර සඳහා පුරප්පාඩු 09 ක් ද, ලඝුලේඛක තනතුර සඳහා තථ්‍ය සේවක නිලධාරින් තිදෙනකු තාවකාලික අනුයුක්තීන් මත සේවය කරනු ලබන බැවින්, ලඝුලේඛක තනතුරෙහි පුරප්පාඩු 06 එලෙසම පවතින අතර, මේ වන විට බඳවා ගැනීම සඳහා කටයුතු සිදු කරන බව දන්වා තිබුණි. | සේවක පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කර ගැනීමටත් අතිරික්ත සේවක සංඛ්‍යාව සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමටත් කටයුතු කළ යුතු ය. |